WORKED.


# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 11,586 — 1958 නොවැම්බර් 15 වැනි සෙනසුරාද — 15.11.1958**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඬ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය–සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1950 අංක 25 දරණ ආහාර පාලන පනත

#### අංක 104 දරන නියෝගය

1950 අංක 25 දරන ආහාර පාලන පණතේ 4 (1) (i) වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව, කෘෂිකර්ම හා ආහාර ඇමති තැන්පත් දෙන් පිලිප් රූපසිංහ ගුණවර්ධන වන මම, ලංකාවේ එක් තැනෙක සිට ලංකාවේ තවත් තැනකට හාල් කිසියම් ප්‍රමාණයක් ප්‍රථමයෙන් සඳහන් කළ ස්ථානය ඇතුළත් ප්‍රදේශයේ ආහාර පාලක තැන විසින් හෝ නියෝජ්‍ය ආහාර පාලක තැන විසින් හෝ සහකාර ආහාර පාලක තැන විසින් හෝ ඔවුන් වෙනුවෙන් නිකුත් කළ බලපත්‍රයක් උඩ එවැනි බලපත්‍රයකට අන්තර්ගත කොන්දේසි අනුව විනා රථවාහන වලින් ගෙනයාම හෝ අන් අයුරකින් යැවීම මෙම නියෝගයෙන් තහනම් කරමි.

මෙම නියෝගයේ ඉහත පෙනෙන තහනම පහත සඳහන් ක්‍රියාවන්ට බලපවත්වන්නේ නැත :—

(අ) මෙරට වගාකළ හාල් සේරු 400 කට වැඩි නොවන ප්‍රමාණයක් රථවාහන වලින් හෝ අන් අයුරකින් ගෙනයෑම ;

(ආ) ලංකාණ්ඩුව වෙනුවෙන් කිසියම් හාලක් රථ වාහන වලින් හෝ අන් අයුරකින් ගෙනයෑම ;

(ඇ) හාල් සලාක පොතක් සහිත යමෙකු එම පොතෙන් කිසියම් කූපනයක් භාරදී ලබාගන්නා හාල් ප්‍රමාණය එම හාල් ප්‍රමාණය ලබාගත් ස්ථානයේ සිට එම පොත අයිතිකරුගේ නිවාස ස්ථානය කරා රථ වාහන වලින් හෝ අන් අයුරකින් ගෙනයෑම ; හෝ

(ඈ) නියෝජ්‍ය ආහාර පාලක තැන විසින් හෝ ඔහු වෙනුවෙන් නිකුත්කළ රිසිට්ටුවක් හෝ බලපත්‍රයක් සහිතව හෝ හාල් තොග වෙළෙන්දෙකු විසින් නිකුත් කළ රිසිට්ටුවක් සහිතව යමෙකු එම රිසිට්ටුවේ හෝ බලපත්‍රයේ සඳහන් හාල් ප්‍රමාණය එම හාල් ප්‍රමාණය ලබාගත් ස්ථානයේ සිට එම රිසිට්ටුවේ හෝ බලපත්‍රයේ සඳහන් තොග වෙළඳතැනගේ සමුපකාරයේ හෝ බලය ලත් වෙළඳතැනගේ ගබඩාවට හෝ වෙළඳ පොළට රථවාහන වලින් හෝ අන් අයුරකින් ගෙනයාම.

ඉහත (ඈ) යටතේ සඳහන් '' තොග වෙළෙන්දෙකු '' යනුවෙන් හැඟවෙන්නේ, සමුපකාර බඩු ගබඩාවලට හෝ සමුපකාර කඩවලට හෝ බලයලත් වෙළෙන්දන්ට පාලනයට යටත්වූ කිසියම් ද්‍රව්‍යයක් බෙදහරින්නෙකු වීම සඳහා 1952 ආහාර පාලන රෙගුලාසිවල '' ඊ '' ශීර්ෂයේ iii කොටසේ 5 වැනි රෙගුලාසිය යටතේ නියෝජ්‍ය හෝ සහකාර ආහාර පාලකයෙකු විසින් බලය දෙනලද 1949 අංක 21 දරන පණතින් සංශොධිත 1936 අංක 16 දරන සමුපකාර සමිති ආඥා පණතේ 6 වැනි වගන්තිය යටතේ ලියාපදිංචි කරනලද සමුපකාර කඩ සමිති සංගමය, සමුපකාර තොග වෙළඳ ආයතනය හෝ ඒ සඳහා වෙනයම් සුදුසු පුද්ගලයෙකු වේ.

ඉහත (ඈ) යටතේ සඳහන් '' බලයලත් වෙළෙන්දෙකු '' යනුවෙන් හැඟවෙන්නේ නියෝජ්‍ය හෝ සහකාර ආහාර පාලකවරයෙකු විසින්, 1952 ආහාර පාලන රෙගුලාසිවල '' ඊ '' ශීර්ෂයේ iii වැනි කොටසේ 5 වැනි රෙගුලාසිය යටතේ, පාලනයට යටත්වූ කිසියම් ද්‍රව්‍යයක් නියමිත ප්‍රදේශවලට, ආයතන වලට හෝ කණ්ඩායම් වශයෙන් සිටින මිනිසුන්ට බෙද හැරීම සඳහා බලය දෙනු ලැබූ වෙළෙන්දෙකු හෝ ඒ සඳහා සුදුසු වූ වෙනත් පුද්ගලයෙකුවේ.

1958 නොවැම්බර් 15 වැනි දින,
කොළඹ, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේදී ය.

ඩී. පී. ආර්. ගුණවර්ධන,
කෘෂිකර්ම හා ආහාර ඇමති.

3435—ජේ. ඇන්. ආර් 26898—4,787 (11/58)

# මිල පාලන දන්වීම්

**කේ. ඊ. 42 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය** | **අතිරේක ආහාර ද්‍රව්‍ය**

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**නියෝගය**

කැගලු දිසාවේ උප (ආහාර) මිළ පාළක තැන්පත් නාගමුත්තු පුලේන්දිරන් වන මම, 1950හේ අංක 29 දරණ මිළ පාලන පනතේ අංක 3(2) දරණ වගන්තිය සමඟ කියවිය යුතු අංක 4 දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1958 සැප්තැම්බර් මස 2 වැනි දින අංක 11,511 දරණ ආණ්ඩුවේ අති විශෙෂ ගැසැට් පත්‍රයේ පළකරනලද 1958 අගෝස්තු මස 27 වැනි දින අංක කේ. ඊ. 40 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගයේ 1 වැනි තීරයෙහි සඳහන් අර්තාපල් පිළිබඳව එම උපලේඛනයේ 2 වැනි සහ 3 වැනි තීරයන්හි පිළිවෙළින් සඳහන් තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළද, සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළද මෙම නියෝගයෙන් අද දින සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යය තොගවෙළෙන්දකු විසින් තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දකු විසින් පාරිභෝගිකයකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, කැගල්ල දිස්ත්‍රික්කයේ සීමාවන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ, මේ දන් පටන්, මේ උපලේඛනයේ 2 වැනි හා 3 වැනි තීරවල අනු පිළිවෙලින් සඳහන්කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාය්‍යී සඳහා—

(අ) උපලේඛණයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යය ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යය වරකට ශුද්ධ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ආ) උපලේඛනයේ සඳහන් යම් ද්‍රව්‍යයකින් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ ශුද්ධ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ කැගලු දිසාවේ සීමාවන් ඇතුළත උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ කැගලු දිසාවේ සීමාවන් ඇතුළත යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක්, සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දකුම එම ප්‍රදේශය සඳහා උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරනලද දන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාය්‍යීය සඳහා ''රාත්තල'' හෙවත් ''රා.'' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ කැගලු දිසාවේ සීමාවන් ඇතුළත උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යය තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යය සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් —

(අ) විකුණූ දිනය;

(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුවයි);

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග;

(ඉ) විකුණූ ද්‍රව්‍ය පිළිබඳ විස්තරය ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(8) උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍යය යම්කිසි දෙයක ඔතනු ලැබේනම් නැතහොත් බහාලනු ලැබේ නම් එහි මිළත් උපලේඛනයේ 2 වැනි සහ 3 වැනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බවද නියම කරමි.

(9) ඕලන්දයෙන් ලෑලි පෙට්ටිවල ගෙන්වනලද අර්තාපල් විකුණන විට දළබරින් තාරබර වශයෙන් පෙට්ටියකට රාත්තල් දහයක් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

(10) චීනයෙන් ලෑලි පෙට්ටිවල ගෙන්වන ලද අර්තාපල් විකුණන විට දළබරින් තාරබර වශයෙන් පෙට්ටියකට රාත්තල් දහතුනක් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

(11) ජපානයෙන් ලෑලි පෙට්ටිවල ගෙන්වන ලද අර්තාපල් විකුණන විට දළබරින් තාරබර වශයෙන් පෙට්ටියකට රාත්තල් විසිපහක් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

(12) ලෑලි පෙට්ටිවල හැර වෙනයම් කිසිවක බහා අර්තාපල් විකුණන විට අර්තාපල් බහා ඇති එම එක එක භාණ්ඩය සඳහා රාත්තල් තුන බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද, හා

(13) මෙම නියෝගය සඳහා ''ශුද්ධ'' යන්නෙන් හැඟවෙන්නේ දළබරින් තාරබර අඩුකොට ඉතිරි වන බර හෝ අර්තාපල්වල පමණක් බර බවද මෙයින් නියම කරමි.

වර්ෂ 1958වෙ ඔක්තෝබර් මස 20 වැනි දින පෙරවරු 11ට කෑගල්ලේ දී අත්සන් කරනලදි.

නාගමුත්තු පුලේන්දිරන්,
කැගලු දිසාවේ උප (ආහාර) මිළපාලක.

උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය |
|---|---|---|
| | තොග වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
| | රු. ශ. | රු. ශ. |
| අර්තාපල් ... ... ... | 31 01 ... | 0 33 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ නියමිත මිළ නොවේ. මෙවා ඒ ද්‍රව්‍යය විකිණිය හැකි ඉහළම වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යය විකිණිය නොහැකිය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.